10 ශ්‍රේණිය

සිංහල

ගුත්තිල වෙණ නද

(වෑත්තෑවේ හිමි විසින් කෝටිටේ අවධියේ රචනා කරන ලද්දකි)

සැකසුම හා අන්තර්ගතය - කේ. ඒ. ඉන්දික නිරෝෂන් - වයඹ/කිවුලකැලේ මහා විද්‍යාලය , පුත්තලම.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

30 ළඟ ළඟ වා උනුනට කර වාදය
නොවරදවා විණා පද වාදය
රඟ අඟ වා සුර-නරඟන බේදය
සෙද කරවා රජ සබය පබෝදය

අර්ථය

වීණා වාදනය නොවරද්දා ඔවුනොවුන්ට ළං ළං වී තරගයට නටන සුරඟනන්ගේ නැටුමෙන්, නරඟනන්ගේ නැටුමේ වෙනස මැනවින් දක්වා රාජ සභාව ප්‍රබෝධ කළහ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

31 යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී
අහසින් බැස රඟ ගත් රඟ කෙලෙසී
දිසි මෙන් විය විදුලිය සිය දහසී

අර්ථය

දිව්‍ය විලාසිනීන් පහත බලා ගත් ඇසින් හෙළන්නා වූ බැල්මෙන්, ජනයාගේ සිත් ඒකාන්තයෙන් එක සේ මත් විය. අහසින් බැස නටන්නට වූ ආකාරය කෙසේ ද? යත්, එකවර ලක්ෂ ගනනක් විදුලි කොටන්නාක් මෙන් විය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

32 දිමුතු යසස් වන කුසුම සරාගේ
නුමුතු සුවඳ මල් පැළඳ සරාගේ
දකුතු රඟන සුරඟන රඟ ලාගේ
උමතු නො වෙ ද කෙලෙසක සිත කාගේ

අර්ථය

අනංගයාගේ දීප්තිමත් කීර්තිය වැනි සුවඳ නො මිදුණා වූ, මල් හිස් හි පැලඳ නටන්නා වූ දිව්‍යාංගනාවන් රඟන විලාසය දුටු කල්හි, කවරෙකුගේ සිත වුව ද උමතු නොවන්නේ කෙසේ ?

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

33 රූ රසේ අඳිනා ලෙසේ අත් - ලෙළ දිදී විදුලිය පබා
රන් රසේ එක වන ලෙසේ **වෙණ** - නාදනු පා තබ තබා
කම්පසේ දෙන සැර ලෙසේ දෙස - බල බලා නෙතඟින් සබා
මම් කෙසේ පවසම් එසේ වර - සුර ලඳුන් දුන් රඟ සුබා

අර්ථය

විදුලි එළියෙන් යුත් සුරඟනන්ගේ අත් ලෙළ දෙමින් රූප රාශියක් අඳින්නා සේය. රන් හා රසදිය එක්වෙන්නාක් මෙන් වීණා නාදයට අනුව පාද තබයි. අනංගයා නිලුපුල් මල් හී විදින්නා සේ නෙතගින් සභාව දෙස බලයි. එවන් උත්තම සුරංගනාවන්ගේ රංගනයේ ස්වභාවය මම් කෙසේ පවසම් ද?

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

34 පුන් මදාරා මල් දමින් මුදු - දිගු සුනිල් වරලස ගොතා
මන් මදා කිතු ලිය ලෙසින් උර - තුර සරා දිලි මුතු ලතා
මන් නදා වන මිණි මෙවුල් නද - වෙණ නදින් එක කොට ඉතා
උන් එදා දුන් රඟ දුටොත් තව - සක් සැපත් කවරෙක් පතා

අර්ථය

පිපුණු මදාරා මල් දමින් මෘදු වූ, ඉතා දික් වූ, ඉතා නීල වර්ණ කේෂ කලාපය ගොතාගෙන, අනංගයාගේ කිර්ති ලතාව මෙන් වූ මුතු වැලින් ළමැද සරසාගෙන, සිත් සතුටුවන මැණික් ගෙප්පි හඬ වීණා නාදය හා අතිශයින් සංකලනය කරමින්, උන් එදා දුන් රංඟනය දුටහොත් ශක්‍ර සම්පත්තියෙන් තව කවරක් පතම් ද?

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

විවිධ විරිත් භාවිත කිරීම

විරිත යනු ලුහු ගුරු අක්ෂර යෙදී ඇති වින්‍යාසය හෙවත් රටාවයි. පද්‍යයේ වඩා තීව්‍රර ශබ්ද රස ජනනය වීමට විරිත් භාවිතය හේතු වෙයි. නියමිත පද්‍ය කොටස අධ්‍යනය කිරීමේ දී ආකාර තුනක විරිත් භාවිත වී ඇති බව හෙළිවෙයි.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

විවිධ විරිත් භාවිත කිරීම

1 – 13 දක්වා පද්‍යයන්හි භාවිත කොට තිබෙන්නේ ගී විරිතයි.

ගී විරිත

පද්‍ය පාදයන් සතරේ මාත්‍රා 9, 11, 9, 14 ලෙසට පිහිටන්නේ ගී විරිතේ දී ය.

නිදසුන් සඳහා පහත පද්‍යයන් ශ්‍රවනය කර බලන්න.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

විවිධ විරිත් භාවිත කිරීම

14 – 32 දක්වා පද්‍යයන්හි භාවිත කොට තිබෙන්නේ පෙද (පදක) විරිතයි.

පෙද විරිත
පද්‍ය පාදය මාත්‍රා 16කින් යුතුව පිහිටයි. එය මාත්‍රා 4න් 4ර යතිය(විරාමය) පිහිටුවා ගායනය කරනු ලබයි. එවැනි පද්‍ය පාද හතරක් පද්‍යයක පිහිටයි.

නිදසුන් සඳහා පහත පද්‍යයන් ශ්‍රවනය කර බලන්න.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

විවිධ විරිත් භාවිත කිරීම

33 – 34 දක්වා පද්‍යයන්හි භාවිත කොට තිබෙන්නේ නුපුන් සඳ විරිතයි.

නුපුන් විරිත
පද්‍ය පාදය මාත්‍රා 7, 7, 7, 5 ලෙස යතිය(විරාමය) මාත්‍රා 26කින් යුතුව පිහිටයි.
එවැනි පද්‍ය පාද හතරක් පද්‍යයක පිහිටයි.

නිදසුන් සඳහා පහත පද්‍යයන් ශ්‍රවනය කර බලන්න.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පද්‍යයේ විශේෂත්වය 1

වැත්තැවේ හිමි ගුත්තිල ගාන්ධර්වයාගේ වීණා වාදනයේ විශේෂත්වය/හැකියාවේ තරම ප්‍රකාශකර තිබෙනුයේ අවට පරිසරයේ සිටි ජීවී පිරිස් එම අවස්ථාවේ හැසිරී ඇති අරුම පුදුම ආකාරය විස්තර කර දැක්වීමෙනි. ඒ අයුරු මෙසේ හඳුනා ගනිමු.

1 මදැතුන් කන් නොසලා සිටි හෙයින් මී මැස්සන් පියාපත් නොගසා කොපුල් තුළටම වී සිටීම------(පද්‍ය 15)

2 අශ්ව සේනා පිළිරූ සේ නොසෙල්වී සිටීම.-------(පද්‍ය 16)

3 රජ්‍යාරක්ෂකයන් අතැති අවි ගිලිහී වැටීම.--------(පද්‍ය 17)

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පද්‍යයේ විශේෂත්වය 2

4 කාන්තාවන්ගේ උකුලේ හුන් දරුවන් බිම වැටීම.-(පද්‍ය 18)

5 මාළු රංචු ගං වෙරළට රැසිව සිටීම. -(පද්‍ය 19)

6 කුරුල්ලනු පියාපත් නොසලා ආකාශයේ සිටීම. -(පද්‍ය 20)

7 බොහෝ චංචල රිළවුන් ද නිසලව සිටීම. -(පද්‍ය 21)

8 මිහිරි කොවුල් නාදය අවමානයට ලක්වීම -(පද්‍ය 22)

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පද්‍යයේ විශේෂත්වය 3

9 ගුරුල්ලන් සහ නයින් එකට ලංව සිටීම.- (පද්‍ය 23)

10 කිඳුරන් වන්දිභට්ටයන් සේ සිටීම. -(පද්‍ය 24)

11 මොණරුන් කන් බොහෝ නැතිහෙයින් දුක් වීම. (පද්‍ය 25)

12 ගිරවුන් තුඩග වූ මී අඹ නීරසයැයි ඉවත දැමීම. (පද්‍ය 26)

13 සිතිවිලි නැති රූප සේ මුවන් නිශ්චලව සිටීම (පද්‍ය 27)

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පාඩමේ අපට හමුවන මූසිල 1

ගුත්තිල ඇදුරුතුමාට දෙවෙනුව, රජු ප්‍රමුඛ මැති ඇමති සමූහයා, සිවුරඟ සේනාව, ශක්‍රයා ප්‍රධාන දේව් මිනිස් සමූහයැති සභාවට පැමිනෙන මූසිල සංගීතඥයා

" නොදැන ම තමා බල
සබයට අවුත් නො පැකිල "

ලෙසට සිය හැකියාවන් පිළිබඳව නිසි ලෙස නොදැන පැකිළීමකින් තොරව සභාවට පැමිණ, දේව ගාන්ධර්වයන් සේ සම සම ව වීණා වාදනයේ යෙදෙයි.

කෘත උපකාර අමතක කිරීම, ජයග්‍රහණයේ ආශාවෙන් වික්ෂිප්ත මනසින් යුතුව සිය වීණා තත් සිඳ දැමීම ඔහු කළ අනුවන ක්‍රියාවන් ය.

(ඉතිරියට අනෙක් පිට බලන්න)

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පාඩමේ අපට හමුවන මූසිල 2

“ කෙළෙහි ගුණ සින්දේ
මූසිල අන්ද මන්දේ
ජයෙහි ලොබ බැන්දේ
තමා විණා තතද සින්දේ ”

යන පද්‍යයෙන් ඒ වග තහවුරු කළ හැකි ය. මෙ ලෙස කෘත ගුණ සිහි නොකිරීම පහත් මනුෂ්‍ය ලක්ෂණයකි. ගුරුන් ගුණ සිහි නෙකොරීම සහ ඔහු ගේ ගුණ නොතකමින් වාදයට යාම ද ගුණමකු කමකි. මෙම තත්වය අද සමාජයට උතුම් පරමාදර්ශවත් පැවැත්මක් නම් කෙසේ විය යුතු ද යන්න හඳුනා ගැනීමට උචිතය.

(ඉතිරියට අනෙක් පිට බලන්න)

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පාඩමේ අපට හමුවන මූසිල 3

“ අනුවණකම් කෙළේ
ගුරුන් සිහි නො කළේ
නද ඉන් නො පතළේ
අයස ම ය මුළු දියත පතළේ ”

මෙහි දැක්වෙන ලෙසට අනුවන කම් කිරීමෙන් සහ තතු නොදැන වීණා තත් සිඳ දැමීම හැකියාව නසාගෙන අපකීර්තියට පත් වීමට කරුණු යෙදී තිබෙයි.

මේ අනුව බැලීමේදී පාඩම තුළ ගුරුවරයාගේ තත්වය වටහා නොගැනීම, ඔහු හා වාදයට එක්වීම, අනුවණ ලෙස කටයුතු කිරීම, ගුරුන්ගේ ගුණ සිහි නො කිරීම වැනි නොමිනිස් ගති සහිත ගෝලයෙක් ලෙස අපට හමුවන මූසිල හඳුනාගත හැකි ය.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

සමාප්තයි.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk